000760

AL/2025/48/STE-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

# ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය I
# கிரேக்க, உரோம நாகரிகம் I
# Greek and Roman Civilization I

48 STE I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය / சுட்டெண் / Index No ..............................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.
பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும்.
**For Examiner's use only.**

| ප්‍රශ්න අංක<br>வினா இல.<br>Question No. | ලකුණු<br>புள்ளிகள்<br>Marks |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව<br>மொத்தம்<br>Total | |

| | අත්සන<br>கையொப்பம்<br>Signature | සංකේත අංකය<br>குறியீட்டு எண்<br>Code Number |
|---|---|---|
| පළමු පරීක්ෂක<br>முதலாவது பரீட்சகர்<br>First Examiner | | |
| දෙවන පරීක්ෂක<br>இரண்டாவது பரீட்சகர்<br>Second Examiner | | |
| අතිරේක / ප්‍රධාන පරීක්ෂක<br>மேலதிக / பிரதான பரீட்சகர்<br>Additional/Chief Examiner | | |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක<br>மதிப்பீட்டுப் புள்ளிகளை<br>உறுதிப்படுத்தும் பரிசோதகர்<br>Evaluation Marks Finalizer | | |
| ප්‍රධාන පරීක්ෂක<br>பிரதான பரீட்சகர்<br>Chief Examiner | | |

0606000188110760

[ 2 වැනි පිටුව බලන්න/பக். 2 ஐப் பார்க்க/See page two

Past Papers Wiki



## (48) ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* **I** කොටසෙහි **1** සිට **30** දක්වා ඇති ප්‍රශ්නවලට **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.
* **II** කොටසෙහි **31** සිට **50** දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු දී ඇති තිත් ඉර මත ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු **එක් භාෂාවකින්** පමණක් සැපයිය යුතුයි.

### I කොටස - ග්‍රීක හා රෝම ඉතිහාසය

1. මයිසීනියානු ශිෂ්ටාචාරය සමෘද්ධිමත් වූයේ පහත සඳහන් කුමන කාල පරිච්ඡේදයක දී ද?
(1) ක්‍රි.පූ. 3000-2000 (2) ක්‍රි.පූ. 2000-1600 (3) ක්‍රි.පූ. 1600-1100
(4) ක්‍රි.පූ. 1100-800 (5) ක්‍රි.පූ. 800-500 (......)

2. ග්‍රීක වීර යුගයේ නිර්වචන ලක්ෂණයක් වඩාත් හොඳින් විස්තර කෙරෙන වරණය තෝරන්න.
(1) ජීවිතයට වඩා විශාල වීරයන් සහ ඔවුන්ගේ අසාමාන්‍ය ක්‍රියාවන් අගය කිරීම
(2) තර්කනය සහ හේතුව අවධාරණය කිරීම
(3) සිවිල් යුතුකම සහ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි අවධානය යොමු කිරීම
(4) සාමවාදය සහ අවිහිංසාව ප්‍රවර්ධනය කිරීම
(5) ඊජියන් ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය (......)

3. ස්පාර්ටන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කතිපයාධිකාරී (oligarchic) සහ ප්‍රජාතන්ත්‍රවාදී (democratic) අංග දැක්වෙන වරණය තෝරන්න.
(1) රජවරුන් දෙදෙනෙකු සහ ගෙරූසියාව (Gerusia)
(2) රජවරුන් දෙදෙනා සහ එෆෝර්ස් (Ephors)
(3) ගෙරූසියාව සහ එෆෝර්ස් (Gerusia and Ephors)
(4) වැඩිහිටි කවුන්සිලය සහ අපෙල්ලාව (Apella)
(5) ආර්කන්වරු (Archons) සහ සෙනෙට් සභාව (......)

4. ලයිකර්ගස්ගේ නීති සම්පාදනයේ ප්‍රතිඵලය වන්නේ,
(1) පොදු භෝජන ශාලා (syssitia) තහනම් කිරීමයි.
(2) ධනය සහ සුඛෝපභෝගිත්වය දිරිමත් කිරීමයි.
(3) ස්පාර්ටන්වරු පර්සියානුවන්ගේ සතුරන් බවට පත් කිරීමයි.
(4) ස්පාර්ටන්වරු වෘත්තියමය සොල්දාදුවන් බවට පත් කිරීමයි.
(5) ස්පාර්ටාව වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමයි. (......)

5. සොලොන්ගේ සෙයිසක්තෙයියා (seisachtheia) ප්‍රතිසංස්කරණය හඳුන්වාදීමට තුඩු දුන් අරමුණ වන්නේ,
(1) දුප්පත් පුරවැසියන් ණය බරින් නිදහස් කිරීම ය.
(2) නව වෙළඳ මාර්ග ස්ථාපිත කිරීම ය.
(3) ඉඩම් සමානව නැවත බෙදා හැරීම ය.
(4) වඩා ශක්තිමත් හමුදාවක් ගොඩනැගීම ය.
(5) ජනතාවට බලය ලබාදීම ය. (......)

6. ග්‍රීක ඒකාධිපති පාලනයේ ප්‍රතිවිපාකයක් **නොදක්වන** වරණය වන්නේ,
(1) සමකාලීන ග්‍රීසියේ කතිපයාධිකාරී (oligarchic) සම්ප්‍රදායන් බිඳ දැමීමයි.
(2) වංශාධිපතියන් සහ සාමාන්‍ය ජනතාව අතර වෙනස වැඩි කිරීමයි.
(3) ජනතාවට විවෘත නව ආගමික උත්සව හඳුන්වාදීමයි.
(4) ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමයි.
(5) කලාවන් හා සාහිත්‍යය දියුණු කිරීමයි. (......)

000760

7. ඇතීනියානු සමාජයේ වර්ධනය උදෙසා ක්ලයිස්තනීස් දැක්වූ දායකත්වයක් වන්නේ,
   (1) කවුන්සිලයේ (Boule) සාමාජිකයන් ප්‍රමාණය වැඩි කිරීම ය.
   (2) පුරවැසියන් සඳහා පීතෘනාමික (patronymic) සංකල්පය හඳුන්වාදීම ය.
   (3) රාජ්‍ය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා පුරවැසියන්ට වෙළඳ කටයුතුවල නිරතවීමට ඉඩදීම ය.
   (4) සමාජ ප්‍රගතිය උදෙසා සාම්ප්‍රදායික වංශාධිපති බල ව්‍යුහයන් ප්‍රවර්ධනය කිරීම ය.
   (5) පවුල් හෝ වංශ වෙනුවට වසම් (demes) මත පදනම්ව ගෝත්‍ර ප්‍රතිසංවිධානය කිරීම ය. (……)

8. පෙරික්ලීස් විසින් ඉදිකරනු ලැබූ ඇතීනා දෙවඟන උදෙසා පමණක් කැප කරන ලද ස්මාරකයක් වන්නේ,
   (1) ඩෙලෝස්හි දේවාලය ය.
   (2) ප්‍රොපිලේයා ය.
   (3) පාර්තෙනොන් ය.
   (4) ඩෙල්ෆිහි දේවාලය ය.
   (5) සූනියොන්හි දේවාලය ය. (……)

9. පර්සියානුවන්ගෙන් ග්‍රීසිය බේරාගත් සේ සැලකිය හැකි ග්‍රීක ජෙනරාල්වරයා වන්නේ,
   (1) ඇල්සිබියාඩීස් (Alcibiades) ය.
   (2) කිමොන් (Cimon) ය.
   (3) නිකියාස් (Nicias) ය.
   (4) පෙරික්ලීස් (Pericles) ය.
   (5) තෙමිස්ටොක්ලීස් (Themistocles) ය. (……)

10. **පළමු තීරුවේ** සඳහන් සංග්‍රාමයේ නමට ගැළපෙන විස්තරය නිසි අනුපිළිවෙළින් **දෙවන තීරුවේ** දක්වා ඇති වරණය තෝරන්න.

| පළමු තීරුව | දෙවන තීරුව |
|---|---|
| මැරතන් සංග්‍රාමය (ක්‍රි.පූ. 490) | A - ග්‍රීක බලඇණිය තෙමිස්ටොක්ලීස් යටතේ පර්සියානු නාවික හමුදාවට එරෙහිව සිදු කළ නාවික සංග්‍රාමය |
| තර්මොපිලේ සංග්‍රාමය (ක්‍රි.පූ. 480) | B - ග්‍රීකයන්ට තීරණාත්මක ජයග්‍රහණයක් ලබා දෙමින් පර්සියානු ආක්‍රමණය අවසන් කිරීමට හේතු වූ පෝසානියාස් යටතේ ග්‍රීකයන් සිදු කළ අවසාන ගොඩබිම් සංග්‍රාමය |
| සලමිස් සංග්‍රාමය (ක්‍රි.පූ. 480) | C - ග්‍රීක හමුදාව, ස්පාර්ටාහි ලියොනිඩාස් රජුගේ මග පෙන්වීම මත වඩා විශාල පර්සියානු හමුදාවන් රඳවා ගත් සංග්‍රාමය |
| ප්ලැටියා සංග්‍රාමය (ක්‍රි.පූ. 479) | D - පර්සියානුවන්ට එරෙහිව තීරණාත්මක ඇතීනියානු ජයග්‍රහණයෙන් අවසන් වූ මිලිටියාඩීස් යටතේ සිදු කළ පර්සියානුවන්ගේ ග්‍රීක ආක්‍රමණය |
| මයිකාලේ සංග්‍රාමය (ක්‍රි.පූ. 479) | E - අයෝනියා වෙරළ තීරයේ පර්සියානු බලඇණිය විනාශවීමට හේතු වූ ලෙයොටිකිඩාස් නම් ස්පාර්ටන් රජු යටතේ සිදු කළ නාවික සටන |

(1) A,C,E,D,B (2) B,C,D,A,E (3) C,B,A,E,D (4) D,C,A,B,E (5) E,A,B,C,D (……)

11. විවෘත ගැටුමකට සහ පෙලොපොනේසියානු යුද්ධයේ ආරම්භයට තුඩු දුන් ආසන්නත ම හේතුව කුමක් ද?
   (1) එම අවස්ථාවේ කොරින්තියානුවන්ගේ සහාය අපේක්ෂා කළ ඇතන්ස්හි හිටපු මිත්‍ර පාර්ශිකයෙකු වූ පොටිඩෙයියාව ඇතන්ස් රාජ්‍යය විසින් වටලෑම
   (2) ස්පාර්ටාවේ මිත්‍ර පාර්ශිකයෙකු වූ තීබ්ස්, ඇතීනියානු මිත්‍ර පාර්ශිකයෙකු වූ ප්ලැටියා රාජ්‍යයට පහරදීම
   (3) ස්පාර්ටාවේ මිත්‍ර පාර්ශිකයෙකු වූ මෙගාරාවට එරෙහිව ඇතන්ස් රාජ්‍යය පැන වූ ආර්ථික සම්බාධක
   (4) ස්පාර්ටාව සහ එහි මිත්‍ර පාර්ශිකයන් වර්ධනයවන ඇතීනියානු බලය තර්ජනයක් ලෙස සැලකීම
   (5) වර්ධනය වන අධිරාජ්‍යය සමග ඇතන්ස් රාජ්‍යය ඩීලියානු සංධානය පාලනය කිරීම (……)

05060000188110760

[4 වැනි පිටුව බලන්න/பக். 4 ஐப் பார்க்க/See page four

Past Papers Wiki

● පහත ප්‍රකාශ කියවා **12** සහ **13** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - සිසිලිය සම්පත් බහුල ධනවත් දූපතක් ලෙස සලකනු ලැබී ය.
B - එගෙස්ටා/සෙගෙස්ටා රාජ්‍යය ආධාර ඉල්ලනු ලැබී ය.
C - එය බටහිර මධ්‍යධරණියට බලපෑම් කිරීමට සහ ආධිපත්‍යය පැතිරවීමට මාර්ගයක් ලෙස සලකනු ලැබී ය.
D - දක්ෂ ජෙනරාල්වරයෙකු වූ ඇල්සිබියැඩිස් නැවත කැඳවීමට දේශපාලන එදිරිවාදිකම් හේතු විය.
E - ආරක්ෂිත පිහිටාධාර ලැබුන විට පවා වැටලීම දිගට ම පවත්වා ගනු ලැබී ය.

**12.** සිසිලියට එරෙහි ඇතීනියානු ආක්‍රමණයට හේතු දැක්වෙන්නේ ඉහත කුමන ප්‍රකාශ දෙකේ ද?
(1) A සහ B (2) A සහ E (3) B සහ C (4) C සහ D (5) D සහ E (……)

**13.** සිසිලියානු ආක්‍රමණයේ දී ඇතීනියානු අසාර්ථකත්වයට දායක වූ හේතු දැක්වෙන්නේ ඉහත කුමන ප්‍රකාශ දෙකේ ද?
(1) A සහ B (2) A සහ E (3) B සහ C (4) C සහ D (5) D සහ E (……)

**14.** ඇන්ටල්සිඩාස්ගේ සාමය පිළිබඳ නිවැරදිව විස්තර කරන්නේ පහත සඳහන් කවර ප්‍රකාශය ද?
(1) ක්‍රි.පූ. 449 දී ග්‍රීක-පර්සියානු යුද්ධය අවසන් කරමින් ඩීලියානු සංධානය සහ ආර්කමෙනිඩ් අධිරාජ්‍යය අතර වූ ගිවිසුම
(2) ක්‍රි.පූ. 387 දී කොරින්තියානු යුද්ධය අවසන් කරමින් ග්‍රීසියට හඳුන්වා දුන් පොදු සාමය
(3) ක්‍රි.පූ. 421 දී පෙලෝපොනේසියානු යුද්ධයේ පළමු භාගය අවසන් කරමින් ස්ථාපිත කළ ඇතන්ස් සහ ස්පාර්ටා අතර වූ ගිවිසුම
(4) පෙලෝපොනේසියානු යුද්ධය අතරතුර ක්‍රි.පූ. 445/446 දී ඇතන්ස් සහ ස්පාර්ටා අතර වූ ගිවිසුම
(5) පුරා දස වසරක් තුළ පැවති ගැටුම අවසන් කරමින් ඇතන්ස් සහ මැසිඩෝනියාව අතර ක්‍රි.පූ. 346 දී වූ සාම ගිවිසුම (……)

**15.** තීබ්ස් රාජ්‍යයේ විනාශයට හා බිඳ වැටීමට පාදක වූ එම රාජ්‍යයේ ක්‍රියාවක් වන්නේ,
(1) මැසිඩෝනියානු ආධිපත්‍යයට අභියෝග කිරීමයි.
(2) වාණිජ අවශ්‍යතා පුළුල් කිරීමට දැක්වූ අභිප්‍රායයි.
(3) එපමිනොන්ඩාස්ව හමුදාවේ ප්‍රධාන නිලයකට පත් කිරීමයි.
(4) ලෙවුක්ට්‍රා හි සටනින් පසුව තම ආධිපත්‍යය තහවුරු කිරීමයි.
(5) මැන්ටිනෙයාහි දී පර්සියානුවන් පරාජය කිරීමයි. (……)

**16.** රෝම සම්ප්‍රදායට අනුව, රෝම නගරය ආරම්භ කිරීම සිදු වූයේ
(1) ක්‍රි.පූ 753 දී ය. (2) ක්‍රි.පූ 509 දී ය. (3) ක්‍රි.පූ 480 දී ය. (4) ක්‍රි.පූ 476 දී ය. (5) ක්‍රි.පූ 27 දී ය. (……)

**17.** රොමියුලස් සහ රෙමුස් පිළිබඳ විස්තර **නොවන** වරණය මින් කුමක් ද?
(1) ඊනියාස්ගෙන් පැවත එන්නන්
(2) වෘක ධේනුවක විසින් ඇති දැඩි කරවූවන්
(3) රෝමයේ නිර්මාතෘවරුන්
(4) සියුස්ගේ පුත්‍රයෝ
(5) අඟහරුගේ පුත්‍රයෝ (……)

**18.** මුල් රෝමයේ ප්‍රාථමික සමාජ බෙදීම පෙන්නුම් කරන්නේ,
(1) පැට්‍රිෂියානුවන් සහ ප්ලේබියානුවන් ය.
(2) රෝමවරුන් සහ විදේශිකයන් ය.
(3) පුරවැසියන් සහ වහලුන් ය.
(4) ධනවතුන් සහ දුප්පතුන් ය.
(5) ප්‍රජාතන්ත්‍රවාදීන් සහ ජනරජවාදීන් ය. (……)

**19.** දොළොස් ප්‍රඥප්තිවල (Twelve Tables) වැදගත්කම සඳහන් වන්නේ මින් කවර ප්‍රකාශයේ ද?
(1) බලවත් රෝම හමුදාවක් පිහිටුවීම
(2) රෝම පුරවැසිභාවය පිළිබඳ ක්‍රමවේදයක් නිර්මාණය කිරීම
(3) රෝම නීතිය ලේඛනගත කිරීම
(4) රෝම කාසි ක්‍රමයක් හඳුන්වාදීම
(5) පෙරදිග සමග රෝම වෙළඳාම ආරම්භ කිරීම (……)

[ 5 වැනි පිටුව බලන්න/பக். 5 ஐப் பார்க்க/See page five

**20.** රෝම රාජධානියට පසුව ස්ථාපනය කළ ආණ්ඩුක්‍රමය කුමක් ද?
(1) රෝම අධිරාජ්‍යය
(2) රෝම ජනරජය
(3) බයිසැන්තියානු අධිරාජ්‍යය
(4) රෝම සම්මේලනය
(5) රෝම ඒකාධිපති ක්‍රමය (……)

**21.** රෝම ජනරජයේ පරිහානියට තුඩු දුන් හේතුවක් **නොවන්නේ** මින් කවරක් ද?
(1) දේශපාලන අස්ථාවරත්වය සහ සිවිල් යුද්ධ
(2) ආර්ථික අසමානතාවය සහ සමාජ නොසන්සුන්තාවය
(3) බලවත් හමුදා නායකයන්ගේ නැගීම
(4) භූමිය සහ සම්පත් පුළුල් කිරීම
(5) පන්ති අසමානතාවය සහ පොදු අතෘප්තිය (……)

**22.** රෝම ප්‍රයටර්ගේ භූමිකාව පෙන්නුම් කරන්නේ මින් කුමන වරණය ද?
(1) හමුදා නායකයා
(2) ප්‍රධාන පූජකයා
(3) නීති බලාත්මක කරන්නා සහ යුක්තියේ පරිපාලකයා
(4) සෙනෙට් සභාවේ ප්‍රධානියා
(5) සභා ප්‍රධානියා (……)

**23.** සමාජ යුද්ධය අතරතුර ඉතාලි මිත්‍ර පාක්ෂිකයන්ගේ ප්‍රධාන ඉල්ලීමක් වන්නේ කුමක් ද?
(1) තමන් පාලකයන් ලෙස පත්වන නව රාජධානියක් පිහිටුවීම
(2) රෝම පුරවැසිභාවය සහ දේශපාලන අයිතිවාසිකම් ලබා ගැනීම
(3) රෝමයට බදු ගෙවීමෙන් නිදහස්වීම
(4) තමන්ගේ ම කොන්සල්වරුන් තෝරා පත් කරගැනීමට අවසර ලබාගැනීම
(5) ඔවුන්ගේ ආරක්ෂක දෙවියාට දෙව්මැදුරක් තැනීම (……)

**24.** රෝමානු ජනරජය රෝම අධිරාජ්‍යය බවට පත්වූයේ පහත දැක්වෙන කුමන සිදුවීමෙන් පසුව ද?
(1) ජූලියස් සීසර් ඝාතනය
(2) පියුනික් යුද්ධ
(3) ඇක්ටියම් සටන
(4) මේරියස්ගේ හමුදා ප්‍රතිසංස්කරණ
(5) මාර්ක් ඇන්තනිගේ මරණය (……)

**25.** පැක්ස් රොමානා (Pax Romana) හි නිර්වචනය වන්නේ කුමක් ද?
(1) රෝමයේ දැඩි සිවිල් යුද්ධ පැවති කාල පරිච්ඡේදයක්
(2) රෝම අධිරාජ්‍යයේ පැවති සාමයේ සහ සමෘද්ධියේ කාලයක්
(3) රෝමයට හමුදාමය පරාජයන් මාලාවක් අත්වූ කාලයක්
(4) ගෝල් දේශය වෙත රෝමය ව්‍යාප්ත වූ කාල පරිච්ඡේදයක්
(5) රෝමය හමුදාමය වශයෙන් ව්‍යාප්ත වූ කාලයක් (……)

**26.** රෝම භූමිය බොහෝ පුළුල් කළ ජූලියස් සීසර් සිදු කළ සංග්‍රාමයේ නම කුමක් ද?
(1) පියුනික් යුද්ධ (2) මිත්‍රිඩාටික් යුද්ධ (3) සමාජ යුද්ධ
(4) මැසිඩෝනියානු යුද්ධ (5) ගැලික් යුද්ධ (……)

**27.** අධිරාජ්‍යයේ ව්‍යාප්තිය සඳහා රෝම හමුදාවේ කාර්යභාරය වඩාත් හොඳින් විස්තර කෙරෙන වරණය තෝරන්න.
(1) භෞමික වාසි සඳහා රාජ්‍ය තාන්ත්‍රිකභාවය මත විශ්වාසය තැබූ ඉතා අකාර්යක්ෂම බලවේගයක්
(2) විනය සහ සංවිධානය සඳහා ප්‍රසිද්ධ වූ භූමි පුළුල් කළ හැකි වැදගත් මෙවලමක්
(3) රාජ්‍යයේ අන්තර් පාලනය (internal order) පවත්වා ගැනීම සඳහා වූ මෙවලමක්
(4) යටත් කරගත් ප්‍රදේශවලින් පැමිණි කුලීහේවායන්ගෙන් සමන්විත වූ හමුදාවක්
(5) පාබල සෙබළුන්ගෙන් සමන්විත වූ හමුදාවක් (……)

PAST PAPERS WIKI

000760

04060000188110760

**28.** රෝම හමුදා ඉතිහාසයට මේරියස් ලබා දුන් මූලික දායකත්වය වඩාත් හොඳින් විස්තර කරන්නේ මින් කුමන වරණය ද?
(1) සංග්‍රාම සඳහා අලි ඇතුන් භාවිතා කිරීම හඳුන්වාදීම
(2) නව වැටලීම් යුධ ශිල්පීය ක්‍රම දියුණු කිරීම
(3) රෝම හමුදාව වෘත්තිමය සහ ස්ථාවර හමුදාවක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම
(4) පියුනික් යුද්ධවල දී රෝම හමුදාව ජයග්‍රහණය කරා මෙහෙයවීම
(5) රෝම හමුදාව ප්‍රතිසංස්කරණය කිරීමට සල්ලාට සහායවීම (……)

**29.** පළමු ට්‍රයම්විරේටය විස්තර කරන්නේ මින් කුමන වරණය ද?
(1) සීසර්, පොම්පේ සහ ක්‍රැසස් අතර ඇතිවූ අවිධිමත් දේශපාලන සන්ධානයක්
(2) රෝම සෙනෙට් සභාව විසින් පිහිටුවන ලද විධිමත් දේශපාලන සන්ධානයක්
(3) සීසර්, පොම්පේ සහ ක්‍රැසස් විසින් හසුරුවන ලද හමුදා මෙහෙයුමක්
(4) රෝම රාජ්‍යයේ අනුග්‍රහය ලද පොදු ව්‍යාපෘති මාලාවක්
(5) කාර්තජීනියානුවන්ට එරෙහිව සිදු කළ සටනක් (……)

**30.** ඔගස්ටස් යටතේ රෝම රජයේ වූ ප්‍රධාන ලක්ෂණයක් **නොවන්නේ** මින් කුමක් ද?
(1) සෙනෙට් සභාව සැලකිය යුතු බලයක් රඳවා ගැනීම
(2) අධිරාජ්‍යයා විසින් උපරිම අධිකාරී බලය දැරීම
(3) අනුග්‍රහය සහ පක්ෂපාතීත්වය වර්ධනය කරන ක්‍රමවේදයක් පැවතීම
(4) නිතිපතා මැතිවරණ පැවැත්වීම
(5) පොදු වැඩ සහ ගොඩනැගිලි ව්‍යාපෘති වර්ධනය කිරීම (……)

## II කොටස - ග්‍රීක හා රෝම සාහිත්‍යය

- කෙටි පිළිතුරු සපයන්න.

**31.** හිසියඩ්ගේ **වැඩපළ සහ දින නිමිති** (Works and Days) කෘතියට අනුව,

(i) මනුෂ්‍ය වර්ගයාට විනාශය ගෙන ඒම පිණිස සියුස්ගේ උපදෙස් පරිදි දෙවිවරුන් නිර්මාණය කළ "ගැඹුරු සහ සම්පූර්ණ උගුල" හැඳින්වූ නම කුමක් ද?

.......................................................................................................

(ii) එය එවැනි නමකින් හැඳින්වූයේ ඇයි?

.......................................................................................................

**32.** හිසියඩ්ගේ **වැඩපළ සහ දින නිමිති** (Works and Days) කෘතියට අනුව දෙවිවරුන් නිර්මාණය කළ "සම්පූර්ණ උගුල" එවන්නට පෙර මනුෂ්‍ය වර්ගයා පෘථිවියේ ජීවත්වූයේ අනතුරු තුනකින් තොරව ය. ඉන් **දෙකක්** සඳහන් කරන්න.

(i) .......................................................................................................

(ii) .......................................................................................................

**33.** හිසියඩ්ගේ **වැඩපළ සහ දින නිමිති** (Works and Days) කෘතියට අනුව යකඩ වංශයේ ජනතාව අතර යුක්තිය සහ ධර්මිෂ්ටකම නොමැතිබව ඉස්මතු කිරීමට කවියා භාවිත කළ උපමා කතාව කුමක් ද?

.......................................................................................................

.......................................................................................................

**34.** හිසියඩ්ගේ **වැඩපළ සහ දින නිමිති** (Works and Days) කෘතියේ මිනිසකුට ධනවත්වීම සඳහා නියම කර ඇති ක්‍රමය කුමක් ද?

.......................................................................................................

.......................................................................................................

[ 7 වැනි පිටුව බලන්න/பக். 7 ஐப் பார்க்க/See page seven

000760

**35.** ඇරිස්ටොෆනීස්ගේ **බඹරු** (Wasps) නාට්‍යයේ, ප්‍රොක්ලියොන්ව නිවාස අඩස්සියේ තබා ගැනීමේ කාර්යය භාරවුන වහලුන් **දෙදෙනා** නම් කරන්න.

(i) ........................................

(ii) ........................................

**36.** ඇරිස්ටොෆනීස්ගේ **බඹරු** (Wasps) නාට්‍යයේ,

(i) ප්‍රොක්ලියොන් දැඩි ලෙස යාමට කැමති කොතැනට ද?

........................................

(ii) ප්‍රොක්ලියොන්ව කැඳවාගෙන යාමට පැමිණෙන්නේ කවුද?

........................................

**37.** ඇරිස්ටොෆනීස්ගේ **බඹරු** (Wasps) නාට්‍යයට අනුව, ප්‍රොක්ලියොන්ව ඔහුගේ ප්‍රිය ස්ථානයට යාමට පොළඹවන්නේ කුමන අපේක්ෂාවන් ද?

........................................

........................................

**38.** ඇරිස්ටොෆනීස්ගේ **බඹරු** (Wasps) නාට්‍යයේ ප්‍රොක්ලියොන් ව්‍යාජ අධිකරණ නඩු විභාගය අවසානයේ දී සිදු කළ ඔහුව (ප්‍රොක්ලියොන්ව) වඩාත් ම පීඩාවට පත් කළ ක්‍රියාව කුමක් ද?

........................................

........................................

**39.** සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටීටිස්** (Philoctetes) නාට්‍යයට අනුව, වරක් ලෙම්නොස්හි දී තුවාල සහිතව අතහැර දමා ගිය ෆිලොක්ටිටීස්ව සොයා ග්‍රීකයන්ට නැවත එහි පැමිණීමට සිදු වූ හේතුව කුමක් ද?

........................................

........................................

**40.** සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටීටිස්** (Philoctetes) නාට්‍යයේ, ඔඩිසියස්ට අනුව, ෆිලොක්ටිටීස් තුළ සැකයක් ඇති නොවන පරිදි ෆිලොක්ටිටීස් වෙත ළඟාවීමට වඩාත් සුදුසු ග්‍රීකයා නෙයොප්ටොලෙමස් බවට ඇති සාධකය කුමක් ද?

........................................

........................................

**41.** යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** (Alcestis) නාට්‍යයේ පෙරවදනෙහි දැක්වෙන පරිදි,

(i) ඇඩ්මීටස්ගේ වහලකු ලෙසට ඇපොලෝ දෙවියන්ව යැවූවේ කවුද?

........................................

(ii) ඔහුව එසේ යවන ලද්දේ කුමන අපරාධයකට දඬුවමක් ලෙසට ද?

........................................

**42.** යුරිපිඩීස්ගේ **ඇල්සෙස්ටිස්** (Alcestis) නාට්‍යයේ එන ප්‍රධාන තේමාවන් **දෙකක්** සඳහන් කරන්න.

(i) ........................................

(ii) ........................................

03060000188110760

**43.** ටෙරන්ස්ගේ **නැන්දම්මා** (Mother-in-law) නාට්‍යයේ එන ෆිලූමිනාගේ දෙමවුපියන්ගේ නම් සඳහන් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

**44.** ටෙරන්ස්ගේ **නැන්දම්මා** (Mother-in-law) නාට්‍යයට අනුව

(i) විවාහය යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියේ දී බැකිස් බැහැදැකීමට පැමිණි මාමණ්ඩිය කවුද?

..............................................................................................................

(ii) විවාහය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඔහු බැකිස්ගෙන් ඉල්ලා සිටියේ කුමක් ද?

..............................................................................................................

**45.** ඇපොලෝනියස්ගේ **ද වොයේජ් ඔෆ් ආර්ගෝ** (The Voyage of Argo) කාව්‍යයේ, පොසෙයිඩන් දෙවියන්ගේ පුතුන් ලෙස හඳුන්වා දුන් ආර්ගොනෝට්වරුන් **දෙදෙනෙක්** නම් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

**46.** ඇපොලෝනියස්ගේ **ද වොයේජ් ඔෆ් ආර්ගෝ** (The Voyage of Argo) කාව්‍යයේ, ආර්ගෝ නෞකාව ලෙම්නොස් වෙත ළඟා වූ විට,

(i) ලෙම්නියානු බලධාරීන් වෙතට පණිවුඩකරුවකු ලෙස ආර්ගොනෝට්වරුන් යැවූවේ කාවද?

..............................................................................................................

(ii) ඔහුට භාරවුන මෙහෙවර කුමක් ද?

..............................................................................................................

**47.** ඇපොලෝනියස්ගේ **ද වොයේජ් ඔෆ් ආර්ගෝ** (The Voyage of Argo) කාව්‍යයේ ආර්ගොනෝට්වරුන් ඔවුන්ගේ ගමනේ අවසානයට ළඟා වන විට යුෆිමස් (Euphemus) මුහුදු පතුලට විසි කළ පස් කැටියකින් වැඩුණු දූපතේ නම කුමක් ද?

..............................................................................................................

**48.** සිසරෝගේ **මහලු විය** (On Old Age) කෘතියේ, (මහලු විය පිළිබඳ චෝදනා හතර සඳහන් කිරීමට පෙර) සිසෙරෝ සඳහන් කරන ඉතා වියපත් (90 වියැති හෝ 100 වන වියැති) කාලයේ දීත් ක්‍රියාකාරීව කටයුතු කරමින් ශිෂ්‍යත්වයට දායක වූ ග්‍රීක දාර්ශනිකයන් **දෙදෙනා** නම් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

**49.** සිසරෝගේ **මහලු විය** (On Old Age) කෘතියේ සඳහන් පරිදි, අවුරුදු හැත්තෑවක් ජීවත් වූ එන්නියස්ට විඳදරා ගැනීමට සිදු වූ විශාලත ම ජීවන බර **දෙක** මොනවා ද?

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

**50.** සිසරෝගේ **මහලු විය** (On Old Age) කෘතියේ

(i) 'මරණයට ආසන්නතම දෙය' කුමක් ද?

..............................................................................................................

(ii) මෙම තත්ත්වය තුළ මිනිස් ආත්මය හැසිරෙන්නේ කෙසේ ද?

..............................................................................................................

* * *

PAST PAPERS WIKI

[9 වැනි පිටුව බලන්න/பக். 9 ஐப் பார்க்க/See page nine

AL/2025/48-STE-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය II
கிரேக்க, உரோம நாகரிகம் II
**Greek and Roman Civilization II**

**48 STE II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.

**Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.**

**උපදෙස්:**

* පහත දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවන සහ හයවන ප්‍රශ්න අනිවාර්ය වේ.** ඊට අමතරව **I** කොටසේ **A** උප කොටසෙන් **එක්** ප්‍රශ්නයක් ද **B** උප කොටසෙන් **එක්** ප්‍රශ්නයක් ද **II** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන තවත් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
* **සියලු ම** ප්‍රශ්නවලට **එක් භාෂාවකින්** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - ග්‍රීක හා රෝම ඉතිහාසය

**1.** පහත සඳහන් මාතෘකාවලින් **පහක්** තෝරාගෙන, එක් මාතෘකාවකට අවම වශයෙන් කරුණු **හතරක්වත්** අඩංගු කරමින්, ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ක්ලෙරුකී
(ii) ටිමොක්‍රසි
(iii) තෙස්මොතෙටායි
(iv) ඇම්ෆිපොලිස් සංග්‍රාමය (ක්‍රි.පූ. 422)
(v) ටිමොලියොන්
(vi) කොමිටියා කෙන්ටූරියාටා
(vii) ලතින් යුද්ධය (ක්‍රි.පූ. 340-338)
(viii) හස්ද්‍රුබාල්
(ix) සාමා සටන (ක්‍රි.පූ. 202)
(x) සෙම්ප්‍රෝනියානු නීති

(ලකුණු 04 × 5 = 20යි)

### A උප කොටස - ග්‍රීක ඉතිහාසය

**2.** (i) මෙසේනියානු යුද්ධ ඇතිවීමට හේතු වූ මූලික සාධක මොනවා ද? (ලකුණු 03 යි)

(ii) ස්පාර්ටානු ආක්‍රමණයට මෙසේනියන්වරු එරෙහිවූ ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 05 යි)

(iii) 'මෙසේනියානු සංග්‍රාම, ස්පාර්ටානු සහ මෙසේනියානු ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් විය'. මෙම ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් පළමු සහ දෙවන මෙසේනියානු සංග්‍රාමවල ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි)

**3.** (i) ඇතන්ස් නගරය මහා බලවතකු බවට පත් කිරීම සඳහා තෙමිස්ටොක්ලීස් දැක්වූ වඩාත් ම කැපී පෙනෙන දායකත්වය සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) ස්පාර්ටානු ජෙනරාල්වරයකු වූ පවුසානියස්ට එරෙහිව ගෙන එන ලද චෝදනාවල ස්වභාවය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iii) ඩීලියානු ලීගයේ අරමුණු ඉටු වූ ආකාරය කෙරෙහි අවධානය යොමු කරමින් එය පිහිටුවීමට හේතු වූ තත්ත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

0202000018811076O

[2 වැනි පිටුව බලන්න/பக். 2 ஐப் பார்க்க/See page two

## B උප කොටස - රෝම ඉතිහාසය

4. (i) මිත්‍රිඩාටීස් යනු කවරෙක් ද? ඔහු පළමු මිත්‍රිඩාටික් යුද්ධය ඇති කළේ කෙසේ ද? (ලකුණු 03 යි)

(ii) ඩාර්ඩනොස් ගිවිසුම බිඳ වැටීමට හේතු සහ දෙවන මිත්‍රිඩාටික් යුද්ධයේ දී රෝමය ප්‍රතිචාර දැක්වූ අයුරු කෙටියෙන් දක්වන්න. (ලකුණු 05 යි)

(iii) 'මිත්‍රිඩාටික් යුද්ධ රෝම ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් විය'. ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර සාධාරණීයකරණය කරන්න. (ලකුණු 07 යි)

5. (i) සුල්ලා සහ මෙරියස් යන අය කවරහු ද? (ලකුණු 03 යි)

(ii) රෝම ජනරජයේ බිඳවැටීමට හේතු වූ සිවිල් යුද්ධ කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(iii) ඔගස්ටස් සීසර් රෝමයට සාමය ගෙනා ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

## II කොටස - ග්‍රීක හා රෝම සාහිත්‍යය

6. **ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයෙහි 6 (a) සිට 6 (g) තෙක්** වූ උද්ධෘත පාඨ අතුරෙන් **පහක්** තෝරාගෙන, ඒවායේ අවස්ථා සම්බන්ධය පෙන්වා, විෂය කරුණු පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 04 × 5 = 20යි)

7. (i) සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටිටීස්** (Philoctetes) හි,

(අ) ෆිලොක්ටිටීස්ට පාළු දූපතක් වන ලෙම්නොස්හි ජීවත්වීමට උපකාර වූයේ කුමක් ද?

(ආ) ඒ කවර ආකාරයකට ද? (ලකුණු 03 යි)

(ii) ඔඩිසියස් නෙයොප්ටොලමස්ව ඔහුගේ (ඔඩිසියස්ගේ) වංචනික කුමන්ත්‍රණයේ සහකරු වීමට පොළඹවන ආකාරය සොෆොක්ලීස්ගේ **ෆිලොක්ටිටීස්** ඇසුරෙන් කෙටියෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 05 යි)

(iii) 'සොෆොක්ලීස් ඔහුගේ නාට්‍යයේ සියලු ම චරිත සහ කතා වස්තුව උපයෝගී කරගනිමින් නාට්‍යයේ ප්‍රධාන චරිතයේ ශාරීරික හා මානසික වේදනාව ඉස්මතු කර ගැනීමටත්, ඔහුගේ ඛේදවාචකය සඳහා හොඳින් සැලසුම් කළ විසඳුමක් ඉදිරිපත් කිරීමටත් කටයුතු කරයි.' ඔබ මෙම ප්‍රකාශය හා එකඟ ද? නාට්‍යය ඇසුරෙන් ඔබේ පිළිතුර සාධාරණීයකරණය කරන්න. (ලකුණු 07 යි)

8. (i) ටෙරන්ස්ගේ **නැන්දම්මා** (Mother-in-law) නාට්‍යයේ කතා වස්තුව කෙටියෙන් දක්වන්න. (ලකුණු 03 යි)

(ii) ටෙරන්ස්ගේ **නැන්දම්මා** හි කතා වස්තුවේ වර්ධනයට උපකාර වෙමින් දරුවාගේ උපතින් පසු නාට්‍යමය උත්ප්‍රාසය සහ ආතතිය වැඩිවීමට පටන් ගන්නා ආකාරය ඉතා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iii) 'ටෙරන්ස්ගේ **නැන්දම්මා** යනු විනෝදාත්මක සුඛාන්ත නාට්‍යයක් වන අතර එහි කාන්තාවන් සහ කාන්තා ඒකාකෘති කතා වස්තුව වර්ධනය සඳහා ප්‍රධාන දායකයන් බවට පත් කෙරෙයි.' මෙම ප්‍රකාශයේ සත්‍යතාවය විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

9. (i) ඇපොලෝනියස්ගේ **ද වොයේජ් ඔෆ් ආර්ගෝ** (The Voyage of Argo) කාව්‍යයට අනුව ජේසන්ට භාරදුන් මෙහෙයුම ඉටු කිරීම සඳහා ආර්ගෝහි ශ්‍රේෂ්ඨ කණ්ඩායමට එක්වුන වීරයන් **තිදෙනකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඇපොලෝනියස්ගේ **ද වොයේජ් ඔෆ් ආර්ගෝ** හි ජේසන් හා මිඩෙයා අතර වූ සම්බන්ධය සහ එය ආර්ගොනෝට්වරුන්ගේ ගමනට කළ බලපෑම කෙටියෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 05 යි)

(iii) ඇපොලෝනියස්ගේ **ද වොයේජ් ඔෆ් ආර්ගෝ** හි ආර්ගොනෝට්වරුන් වීරයන්ගේ ප්‍රජාවක් ලෙස ඉදිරිපත් කර ඇති ආකාරය, එම කෘතිය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

* * *